සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව

**නම/විභාග අංකය :-- ..........................................................................** **කාලය : පැය 02යි.**

### I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 10 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. නාට්‍ය පිටපතක අන්තර්ගත නොවන්නේ,
   1. තේමාව ය. 2. රූපණය ය. 3. චරිතය ය. 4. සංවාද ය.

2. චරිතයක විවිධ පැතිකඩ හඳුන්වන්නේ,
   1. සමාරෝපණය නමිනි 2. අභිනය නමිනි
   3. භූමිකා නමිනි 4. අනුකරණය නමිනි

3. නළුවාට බැහැරින් ගෙන එන අභිනය
   1. ආංගික අභිනයයි 2. වාචික අභිනයයි
   3. සාත්වික අභිනයයි 4. ආහාර්ය අභිනයයි

4. ළමා නාට්‍යයක තිබිය යුතු ලක්ෂණයක් නොවන්නේ,
   1. සංකීර්ණ කතා පුවතක් තිබීම. 2. සීමිත චරිත ගණනක් තිබීම.
   3. මුද, මැද, අග මැනවින් ගලපා තිබීම. 4. අවසානයේ නපුර පරාජය වීම.

5. චරිත අතර ප්‍රතිවිරෝධී අදහස් මතුවීම
   1. චරිත නිරූපණයයි. 2. ගැටුමයි.
   3. සමාරෝපණයයි. 4. තේමාවයි.

6. කදාවළලුු නාට්‍යයේ අංග රචනය සිදු කර ඇත්තේ,
   1. නාට්‍ය ධර්මී ශෛලිය අනුවයි. 2. ලෝක ධර්මී ශෛලිය අනුවයි.
   3. මිශ්‍ර ශෛලිය අනුවයි. 4. අමිශ්‍ර ශෛලිය අනුවයි.

7. යක්ෂයකුට බිලි වීමට ගිය දරුවකු බේරා ගැනීම සම්බන්ධ කතා පුවතක් ඉදිරිපත් වන පූජාකර්මය වන්නේ,
   1. අංගුලිමාල දමනයයි. 2. ආලවක දමනයයි.
   3. නාලාගිරි දමනයයි. 4. සච්චක දමනයයි.

8. දේව දූතයකු ලෙස පෙනී සිටිමින් කෙරෙන රංග අවස්ථාවක් අන්තර්ගත වන්නේ,

1. බෝධිපූජා පිංකමෙහිය.
2. දානමය පිංකමෙහි ය.
3. සති පිරිත් පිංකමෙහි ය.
4. ධර්ම දේශනා පිංකමෙහිය.

A - ''ගහෙන් ගෙඩි එන්නා වාගේ මොනවද ගුණවංශ උඹ මේ කියවන්නේ''

B - ''මමත් හිටියෙ හම්බ වෙන්න
එලොව ගිහින් ආපු කෙනෙක්''

9. ඉහත A හා B සංවාද ඛණ්ඩ අයත් නාට්‍ය ශෛලීන් පිළිවෙලින්,

1. නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී වේ.
2. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී වේ.
3. මිශ්‍ර ශෛලිය හා ලෝක ධර්මී වේ.
4. මිශ්‍ර ශෛලිය හා නාට්‍ය ධර්මී වේ.

10. සමාරෝපයේ ප්‍රධාන ප්‍රභේද ගණන,

1. එකකි
2. දෙකකි
3. තුනකි
4. හතරකි.

- **අංක 11-15 දක්වා දී ඇති ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



A



B



C



D



E

11. කදාවළලු නාට්‍ය නිර්මාණය කළ නිර්මාණකරු සිටින්නේ,

1. A ඡායාරූපයේ ය.
2. B ඡායාරූපයේ ය.
3. C ඡායාරූපයේ ය.
4. D ඡායාරූපයේ ය.

12. D ඡායාරූපයෙන් දැක්වෙන රංග ශිල්පියා වන්නේ,

1. සිරිල් වික්‍රමගේ ය.
2. ශ්‍රියන්ත මෙන්ඩිස් ය.
3. නිශ්ශංක දිද්දෙණිය ය.
4. ජැක්සන් ඇන්තනී ය.

13. E ඡායාරූපයෙන් දැක්වෙන ළමා නාට්‍ය නිර්මාණ ශිල්පිනිය,

1. ට්‍රිලීෂියා ගුණවර්ධන ය.
2. සෝමලතා සුබසිංහ ය.
3. රත්නා ලාලනී ය.
4. මාලනී රණසිංහ ය.

14. නරිබෑණා නාට්‍ය නිෂ්පාදනය කළ නාට්‍යකරු වන්නේ,

1. A ය.
2. B ය.
3. C ය.
4. D ය.

15. C ඡායාරූපයේ සිටින නාට්‍ය නිර්මාණකරු වන්නේ,

1. එදිරිවීර සරච්චන්ද්‍ර 2. දයානන්ද ගුණවර්ධන
3. ගුණසේන ගලප්පත්ති 4. හෙන්රි ජයසේන

- **16 - 20 දක්වා වගන්ති හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

16. වෙස් මුහුණු පැළඳි අවස්ථාවකදී සාත්වික අභිනය මැනවින් ඉදිරිපත් කළ හැකි ය. ( )

17. ''හෝ ගානා පොකුණ'' ජනප්‍රිය වේදිකා නාට්‍යයකි. ( )

18. පසුතල නිර්මාණ නොමැතිව වුව ද ඇතැම් නාට්‍ය වේදිකාගත කළ හැකිය ( )

19. දර්පන තල අභ්‍යාසයෙහි යෙදීමෙන් අනුකරණ කුසලතාව වර්ධනය වේ. ( )

20. සන්නිවේදනය නාට්‍යකට අත්‍යවශ්‍යම සාධකයකි. ( )

---

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 02 ක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු ලියන්න.**

1. ''මේ බලන්න අත්තම්මෙ, මගේ අත් දෙකේ ලස්සන. වළලු දාගත්ත හැම පාටින් ම තෝරල. දැන් මම කිඳුරඟනක් වගේ''

   i. ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍ය පිටපතේ නම හා එහි රචකයාගේ නම ලියන්න.

   ii. නාට්‍ය පෙළක දක්නට ලැබෙන මූලිකාංග හතරක් (4) නම් කරන්න.

   iii. ඉහත නාට්‍ය සඳහා භාවිත කරන ආනුෂාංගික කලාවන් හතරක් (4) නම් කරන්න.

   iv. මෙම නාට්‍ය පිටපත විමසීමේදී දැක ගත හැකි ප්‍රධාන රංග ශෛලීන් නම් කරන්න.

   v. මෙම නාට්‍යයෙහි ඔබ කැමති ගැටුම් අවස්ථාවක් විස්තර කරන්න.

   (ල. 5 x 4 = 20)

2. i. සමාජයේ දැක ගත හැකි විවිධ චරිත 4 ක් දක්වන්න. (ල.4)

   ii. එයින් එක් චරිතයක විවිධ භූමිකා රූප සටහන් මගින් දක්වන්න. (ල.8)

   iii. චරිතයක විවිධ භූමිකා නිරූපණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ල.8)

3. i. සමාරෝපය යන්න හඳුන්වන්න. (ල.6)

   ii. සමාරෝපයේ කොටස් නම් කරන්න. (ල.6)

   iii. එම කොටස් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.8)

4. i. වේෂ භූෂණය යන්න හඳුන්වන්න. (ල.6)

ii. නාට්‍යයක වේෂභූෂණ වැදගත් වන්නේ කෙසේ ද? (ල.6)

iii. වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ල.8)

5. i. වාචික අභිනය ප්‍රගුණ කිරීම සඳහා කළ යුතු අභ්‍යාසය කුමක් ද? (ල.6)

ii. එම අභ්‍යාසය ප්‍රගුණ කිරීම සඳහා භාවිත කළ හැකි ග්‍රන්ථ 02 ක් නම් කරන්න. (ල.6)

iii. එකී අභ්‍යාසය කිරීමෙන් නළු කාර්යය සාර්ථක වන්නේ කෙසේ ද? (ල.8)